**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**2026 ජනවාරි මස 11 දිනය සඳහා කාලගුණ අනාවැකිය**
**2026 ජනවාරි මස 10 දින ප.ව. 2.00 ට නිකුත්කරන ලදී.**

**නිරිතදිග බෙංගාල බොක්ක ප්‍රදේශයේ පැවති පීඩන අවපාතය 2026 ජනවාරි 10 වන දින පෙ.ව. 11.30ට මුලතිව් සිට කිලෝමීටර 20 ක් පමණ නැගෙනහිරින් පිහිටා තිබුණි. එය අද සවස් කාලයේ මුලතිව් ආසන්නයේ වෙරළ තීරය හරහා ගමන් කිරීමට ඉඩ ඇත. එය හෙට දින වන විට අඩු පීඩන ප්‍රදේශයක් දක්වා දුර්වල වීමට හැකියාව පවතී. ඒඅනුව හෙට සිට මෙම පද්ධතියෙන් දිවයිනේ කාලගුණයට ඇති බලපෑම ක්‍රමයෙන් අඩු වේ යැයි අපේක්ෂා කෙරේ.**

උතුරු , උතුරු-මැද, ඌව සහ නැගෙනහිර පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

වයඹ සහ මධ්‍යම පළාත්වල වැසි වාර කිහිපයක් ඇතිවිය හැක.

සෙසු ප්‍රදේශවල සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

උතුරු සහ වයඹ පළාත්වලත් මාතලේ, ත්‍රිකුණාමලය සහ නුවරඑළිය දිස්ත්‍රික්කවලත් විටින් විට හමන **පැ.කි.මී. (30-40) දක්වා වන තරමක් තද සුළං** ඇතිවිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## WEATHER FORECAST FOR 11 JANUARY 2026
**Issued at 2.00 p.m. on 10 January 2026**

**The depression over the southwest Bay of Bengal was located about 20 km East of Mullaitivu at 11:30 a.m. on 10 January 2026. It is likely to cross the Mullaitivu coast around today evening. It is likely to weaken to a low-pressure area by tomorrow. Accordingly, it can be expected that the influence of this system on the island's weather will gradually reduce by tomorrow.**

Showers or thundershowers will occur at times in Northern, North-central, Uva, and Eastern provinces.

Several spells of showers may occur in the North-western and Central provinces.

Showers or thundershowers may occur at a several places elsewhere during evening or night.

Fairly strong winds about (30-40) kmph can be expected at times over Northern, North-western provinces and in Matale, Trincomalee and Nuwara-Eliya districts.

**The general public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2026 ජනවාරි මස 10 දින ප.ව. 2.00 ට නිකුත් කරන ලදී.**

**නිරිතදිග බෙංගාල බොක්ක ප්‍රදේශයේ පැවති පීඩන අවපාතය 2026 ජනවාරි 10 වන දින පෙ.ව. 11.30ට මුලතිව් සිට කිලෝමීටර 20 ක් පමණ නැගෙනහිරින් පිහිටා තිබුණි. එය අද සවස් කාලයේ මුලතිව් ආසන්නයේ වෙරළ තීරය හරහා ගමන් කිරීමට ඉඩ ඇත. එය හෙට දින වන විට අඩු පීඩන ප්‍රදේශයක් දක්වා දුර්වල වීමට හැකියාව පවතී.**

**කොළඹ සිට පුත්තලම, මන්නාරම, සහ කන්කසන්තුරේ හරහා ත්‍රිකුණාමලය දක්වා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල නැවත දැනුම් දෙන තුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.**

කොළඹ සිට ගාල්ල සහ හම්බන්තොට හරහා මඩකලපුව දක්වා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවල යෙදීම වළක්වාලමින් නිකුත් කරන ලද අනතුරු ඇඟවීම ඉවත් කරනු ලැබේ.

**ධීවර සහ නාවික කටයුතුවල යෙදෙන ප්‍රජාව, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන ඉදිරි නිවේදන පිළිබඳව අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

**වැසි තත්ත්වය:**

පුත්තලම සිට මන්නාරම සහ කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල ස්ථාන ස්වල්පයක වැසි ඇතිවිය හැක.

**සුළඟ:**

සුළං උතුරු දෙසින් හමා එයි. කොළඹ සිට පුත්තලම, මන්නාරම සහ කන්කසන්තුරේ හරහා ත්‍රිකුණාමලය දක්වා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය **පැ.කි.මී. (35-45)** පමණ වන අතර විටින් විට **පැ.කි.මී. (60-70)** දක්වා ඉහළ යා හැක. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය පැ.කි.මී. (25-35) පමණ වේ.

**මුහුදේ ස්වභාවය:**

**කොළඹ සිට පුත්තලම, මන්නාරම සහ කන්කසන්තුරේ හරහා ත්‍රිකුණාමලය** දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ **විටින් විට රළු සිට ඉතා රළු වේ**. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ මද වශයෙන් රළු විය හැක.

**කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය** දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල මුහුදු රළ උස **මීටර් (2.5 – 3.5)** ක් පමණ ඉහළ යාමේ හැකියාවක් පවතී. (මෙය ගොඩබිමට එන රළ උස නොවේ).

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

### WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
**Issued at 2.00 p.m. on 10 January 2026**

**The depression over the southwest Bay of Bengal was located about 20 km East of Mullaitivu at 11:30 a.m. on 10 January 2026. It is likely to cross the Mullaitivu coast around today evening. It is likely to weaken to a low-pressure area by tomorrow.**

**Naval and fishing communities are warned not to venture to the deep and shallow sea areas off the coast extending from Colombo to Trincomalee via Puttalam, Mannar and Kankasanthurai until further notice.**

The warning issued to prevent fishing and naval activities in the deep and shallow sea areas from Colombo to Trincomalee via Galle, Hambantota and Batticaloa is withdrawn.

**Naval and fishing communities are requested to be attentive to the forecasts and bulletins issued by the Department of Meteorology in this regard.**

**Condition of Rain:**

Showers or thundershowers will occur at times in the sea areas off the coast extending from Puttalam to Trincomalee via Mannar and Kankasanthurai. Showers or thundershowers may occur at a few places in the other sea areas around the island.

**Winds:**

Winds will be northerly. Wind speed will be **(35-45) kmph** in the sea areas off the coast extending from **Colombo to Trincomalee via Puttalam, Mannar and Kankasanthurai**. Wind speed can increase up to **(60-70) kmph** at times in these sea areas. Wind speed will be **(25-35) kmph** in the other sea areas around the island.

**State of Sea:**

The sea areas off the coast extending from **Colombo to Trincomalee via Puttalam, Mannar and Kankasanthurai** will be **rough to very rough** at times. The other sea areas around the island may be moderate.

The wave height may increase **(about 2.5 – 3.5 m)** in the sea areas off the coast extending from Kankasanthurai to Trincomalee (this is not for land area).

**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි